**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**

**නීතිවේදී උපාධි පාඨමාලාව – 3 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය – 2008 / 2009**

**ශ්‍රී ලංකාවේ නීති පිළිබඳ හැඳින්වීමක් LWU 1411**

**කාලය – පැය 03 යි**

---

**දිනය : 2009. 03. 24** **වේලාව: පෙ. ව. 9.30 - ප. ව. 12.30**

---

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.**

1. "රෝම ලන්දේසි නීතිය දේශයේ පොදු නීතිය බවට පත්වූයේ අධිකරණ විසින් මෙම නීතිය පුද්ගල නීතීන් හි හිස්තැන් පිරවීමට යොදාගත් බැවිනි".

   මෙම කාර්යය සඳහා රෝම ලන්දේසි නීති මූලධර්ම යොදා ගැනීම පහසු කරවූ අධිකරණ තීන්දු ආශ්‍රයෙන් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

2. කපිල, මහනුවර සිරිපුර කොන්ත්‍රාත් සමාගමේ ගණකාධිකාරවරයෙකු විය. ඔහුගේ දෙමාපියන් පේරාදෙණියේ ස්ථිර පදිංචිකරුවෝ වූහ. කපිලගේ පියා උඩරැටියකු වූ අතර වර්ෂ 1949 දී අම්බලන්ගොඩ පදිංචිකාරියක වූ කපිලගේ මව සමග දිග විවාහයක් කරගෙන තිබුණි. කපිල එහි සේවය කරන අතරතුර, එම සමාගමේම තාක්ෂණික නිලධාරිනියක ලෙස සේවය කළ ප්‍රියානි සමඟ පෙමින් බැඳුනේය. ගාල්ල ප්‍රදේශයේ පදිංචිකරුවකු වූ ප්‍රියානිගේ පියා උඩරට කාන්තාවක් වන ප්‍රියානිගේ මව විවාහ කරගෙන තිබුණි. 1962 දී ඔවුහු සාමාන්‍ය නීතිය යටතේ විවාහය ලියාපදිංචි කර තිබුණු අතර මහනුවර පදිංචිව සිටියහ. කපිල හා ප්‍රියානි ඔවුන්ගේ විවාහය උඩරට නීතිය යටතේ ලියාපදිංචි කිරීමට අදහස් කරයි.

   (අ) කපිල සහ ප්‍රියානිට ඔවුන්ගේ විවාහය උඩරට නීතිය යටතේ ලියාපදිංචි කළ හැකිද?

   (ආ) ප්‍රියානිගේ පියා වර්ෂ 1951 දී ඇගේ මව සමග විවාහය, බින්න විවාහයක් වශයෙන් උඩරට නීතිය යටතේ ලියාපදිංචි කර තිබුණි නම් ඔබගේ පිළිතුර වෙනස් වන්නේද?

   ඔබගේ පිළිතුර අදාළ ව්‍යවස්ථා සහ අධිකරණ තීරණ ආශ්‍රයෙන් ඉදිරිපත් කළ යුතුය.

3. "උඩරට නීතියේ ස්වභාවය සහ අන් අය කෙරෙහි එහි අදාළත්වය පිළිබඳව වැරදි මතයක මූලාරම්භයක් විලියම් එ රොබට්සන් නඩු තීන්දුව මගින් ඇති කර විය."

(Principles of Ceylon Law by H.W. Tambiah, p.154)

1830 සිට 1917 කාලවකවානුව තුළදී බලපැවැත්වූ නෛතික තත්වය මෙම ප්‍රකාශයෙන් පිළිබිඹු වේදැයි සාකච්ඡා කරන්න.

4. වේලු 1976 දී ද්‍රවිඩ දෙමාපියන්ට දාව අම්පාරේදී උපන්නේය. ඔහුගේ වයස අවුරුදු හතේදී ඔහුගේ දෙමාපියන් යාපනයට ගිය අතර එහිදී ඔහු පාසැල් අධ්‍යාපනය ලැබුවේය. වයස අවුරුදු 18 දී පාසැල අතහැර ගිය ඔහු මහනුවර සිටි ඔහුගේ මාමාගේ තේ වත්තක නැවතී සේවය කලේය. එම වත්තේම පදිංචි මාලතී නම් ද්‍රවිඩ කාන්තාවක සමග 1998 දී වේලු විවාහ විය. විවාහයෙන් පසු ඔවුන් වාසය කළේ මාලතීගේ දෙමාපියන් විසින් ඔවුනට ත්‍යාග කරන ලද, මහනුවර පිහිටි නිවසකය. වේලු නිරන්තරයෙන්ම තම දෙමාපියන්ට මුදල් යැවූ අතර සෑම මාස දෙකකට වරක්ම දෙමාපියන් බැලීමට යාපනයට ගියේය. ඔහු තම රැකියාවෙන් ලද ආදායමෙන් කොටසක් යාපනයේ පිහිටි මූල්‍ය සමාගමක ආයෝජනය කලේය. වර්ෂ 2000 දී වේලු විසින් යාපනයේ නව නිවසක් මිලදී ගන්නා ලද අතර තමන් නුදුරු අනාගතයේදී යාපනයේ පදිංචියට එන තෙක් එහි වාසය කරන ලෙස තම දෙමාපියන්ගෙන් ඉල්ලා සිටියේය. ඔවුන් අතර නිරන්තරයෙන්ම **ඇති වූ** අඩ දබර නිසා 2001 දී වේලු තම බිරිඳ අතහැර දමා යාපනයේ තම දෙමාපියන් සමග ජීවත් වීමට පැමිණියේය. මහනුවර පිහිටි තම වෛවාහක නිවසේ පදිංචිය මාලතී විසින් තහවුරු කර ගන්නා ලදි. වර්ෂ 2002 දී වේලු යාපනයේ ගොඩනැගිල්ලක් අත් කර ගත් අතර නව වෙළඳසැලක් ආරම්භ කලේය. වේලු වර්ෂ 2008 දී හදිසියේ මිය ගියේය.

වේලුට කුමන නීතියක් අදාළ වන්නේ දැයි දැන ගැනීමට වේලුගේ දෙමාපියන් කැමැත්තෙන් සිටී. ඔවුනට උපදෙස් දෙන්න.

5. "නීති පිළිගැටුම් සහ නීතිය අදාළ කර ගැනීමේදී ඇතිවන විෂමතා අවම කර ගත හැක්කේ ව්‍යවස්ථාදායක හා අධිකරණ මැදිහත් වීමක් හරහා පමණී."

ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

6. විනිශ්චිත නඩු තීන්දු සහ ව්‍යවස්ථාපිත විධිවිධාන ඇසුරින් පහත සඳහන් තත්වයන්ට නෛතික විසඳුම් මොනවාදැයි සාකච්ඡා කරන්න.

(අ) මුස්ලිම් කාන්තාවක වන සොනාරා මුස්ලිම් වෛද්‍යවරයෙකු වූ කාදර් සමග වර්ෂ 1990 දී විවාහ විය. වර්ෂ 1992 දී සොනාරා පිරිමි දරුවකු බිහි කළ අතර ඔහු ජෙෆ්රි නම් වේ. වර්ෂ 1997 දී ජෙෆ්රි නුවර ප්‍රසිද්ධ පාසැලකට ඇතුළත් කරන ලදි. කාදර් විසින් සොනාරා සහ ජෙෆ්රිව අතහැර වෙනත් විවාහයක් කර ගන්නා ලදි. වර්ෂ 2008 දී

සොනාරා තම පුත්‍රයා සඳහා නඩත්තු ඉල්ලා කාදර්ට එරෙහිව නඩත්තු නඩුවක් පැවරුවාය. තමා පෙජ්රි නඩත්තු කිරීම සඳහා බැඳී **නොසිටින** බව කාදර් කියාසිටියේය .

(ආ) බණ්ඩාර විවාහක පුරුෂයෙකු වන අතර ගංගා අවිවාහක කාන්තාවක් වේ. ඔවුන් දෙදෙනා ඉස්ලාම් ධර්මය වැළඳගැනීමට තීරණය කළ අතර 2007 දී මුස්ලිම් නීතිය යටතේ තම විවාහය ලියාපදිංචි කරති.

(ඇ) සෙනීෆ් සහ ෆාතිමා විවාහක මුස්ලිම් යුවලකි. සෙනීෆ් සිය දෙවන විවාහය ගයනි නම් සිංහල කාන්තාවක් සමග සාමාන්‍ය නීතිය යටතේ සිදු කරයි.

7. නිදහසින් පසු යුගයේ දී අධිකරණ ක්‍රමයේ සහ යුක්තිය පසිඳලීමෙහි සිදු වූ ප්‍රධාන වෙනස්කම් සම්බන්ධව සවිස්තරාත්මක සටහනක් ලියන්න.

8. (අ) පූර්ව යටත් විජිත යුගයට පෙර උඩරට රාජධානියේ යුක්තිය පසිඳලීම සම්බන්ධව නිලධාරීන්ට සහ ආයතන වලට පැවරී තිබූ බලතල සාකච්ඡා කරන්න.

(ආ) ලන්දේසි යුගයේ පැවති එක් එක් අධිකරණයේ අධිකරණ බලය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් එම යුගයේදී ඉහළ සිට පහළ දක්වා පැවති අධිකරණ ධුරාවලිය විස්තර කරන්න.

හිමිකම් ඇවිරිණි
***********